278

RARE

# ථෙරවාදීය බුද්ධාභිවාදන ක්‍රම හා අමිතාභ සම්ප්‍රදාය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

| ප්‍රවේශ අංකය | 278 |
| --- | --- |
| වර්ග අංකය | |

පූජ්‍ය බෙල්ලන්විල ධම්මරතන ස්ථවිර

ලියා පදිංචි අංකය:
H/MPhil./BC/9826

කැළණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධනය

2001

# නිබන්ධ සාරාංශය

ථෙරවාද හා අමිතාභ සම්ප්‍රදායයන්හි බුද්ධාභිවාදන ක්‍රමයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් වශයෙන් ආරම්භ කරන ලද මෙම පර්යේෂණයේ දී න්‍යායාත්මක හා ප්‍රායෝගික හෙවත් ක්ෂේත්‍ර අධ්‍යයන යන ක්‍රම දෙක කෙරෙහිම අවධානය යොමු කරන ලදී. න්‍යායාත්මක අධ්‍යයනයේ දී පාලි නිකාය සාහිත්‍යය හා තදනුගත අර්ථකථන සාහිත්‍යය ද සිංහල මාධ්‍යයෙන් රචිත පැරණි වංශකථා, කාව්‍ය නිර්මාණ ආදිය ද, ථෙරවාදය සම්බන්ධයෙන් උපයෝගී කරගන්නා ලදී. ඒවාහි ඇතුළත් කරුණු විශ්ලේෂණය කිරීමේ දී ද්විතීයික මූලාශ්‍ර අවස්ථාවෝචිත පරිදි භාවිතා කරන ලදී. අමිතාභ සම්ප්‍රදායය හා පොදුවේ මහායාන සම්ප්‍රදායය සඳහා සුඛාවතීව්‍යූහ, අමිතායුර්ධ්‍යාන, සද්ධර්මපුණ්ඩරීක වැනි මූලික මහායාන සූත්‍රත් දැනට මූලසංස්කෘතයෙන් නොමැති සූත්‍රවල චීන පරිවර්තනයන්හි ඉංග්‍රීසි අනුවාදනයනුත් භාවිතා කරන ලදී. ඒවාහි ඇතුළත් කරුණු විග්‍රහ කිරීමේ දී අදාළ ද්විතීයික මූලාශ්‍ර උපයෝගී කර ගන්නා ලදී.

මේ සම්බන්ධ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා සිංගප්පූරුවේ ප්‍රකට අමිතාභ මධ්‍යස්ථාන හා පොදුවේ මහායාන මධ්‍යස්ථාන කිහිපයක් ද, ප්‍රකට මහායාන ආචාර්යවරුන් කිහිපපළක් ද, අපගේ අවධානයට යොමු කරන ලදී.

පොදුවේ සෑම බෞද්ධ සම්ප්‍රදායයකටම මුල් වූ පාලි නිකාය සාහිත්‍යය ආශ්‍රයෙන් බුද්ධාභිවාදන ක්‍රමයන්ගේ ඓතිහාසික පසුබිම අනාවරණය කිරීම ප්‍රථම පරිච්ඡේදයේ අරමුණ විය. ඒ අනුව පසුකාලීනව සංවර්ධනය වූ බුද්ධාභිවාදන ක්‍රමයන්ගේ මූලබීජ බහුල ප්‍රමාණයක් නිකාය සාහිත්‍යය තුළ දක්නට ලැබෙන බව අනාවරණය විය.

අමිතාභ සම්ප්‍රදායයේ අතිශයින් ප්‍රචලිත සංකීර්ණ බුද්ධාභිවාදන ක්‍රමයන් කෙරෙහි එම සම්ප්‍රදායයට අයත් ප්‍රාථමික මූලාශ්‍රයන් මගින් ලැබී ඇති දායකත්වය ඉතා ප්‍රබල බව දෙවැනි පරිච්ඡේදයෙන් ප්‍රකට කරන ලදී.

පාලි අර්ථකථන සාහිත්‍යයෙහි මෙන් ම සිංහල සාහිත්‍යයෙහි ද බොහෝ කෘති ඇසුරින් ආදි බෞද්ධ බුද්ධාභිවාදන ක්‍රම පුළුල් ලෙස විකාශනය වී ගිය ආකාරය තෙවැනි පරිච්ඡේදයෙන් ප්‍රකට කිරීමට උත්සාහ ගන්නා ලදී.

සිව්වැනි පරිච්ඡේදය යොමු කරවන ලද්දේ ථෙරවාද හා මහායාන රටවල ක්‍රියාත්මක වන බුද්ධාභිවාදන ක්‍රමයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කෙරෙහි ය. එම ක්‍රම අතර පවතින සදෘශතා මෙන් ම විසදෘශතා ද එහි දී අනාවරණය කර ඇත.

ථෙරවාද හා අමිතාභ යන සම්ප්‍රදාය දෙක්හිම බුද්ධාභිවාදන ක්‍රමයන් අතර විසදෘශතා රාශියක් දක්නට ලැබෙන නමුත් ඒවාහි පදනම විමසා බලන කල්හි දාර්ශනික වශයෙන් මෙන් ම ආචාර විද්‍යාත්මක වශයෙන් ද, සමානතා රාශියක් දැක ගත හැකි විය. පස්වැනි පරිච්ඡේදයෙන් ප්‍රකට වන්නේ එම තොරතුරු ය. එය ද තුලනාත්මක අධ්‍යයනයක් වශයෙන් හඳුන්වා දීම යෝග්‍යය.

ඉහත පරිච්ඡේදයන් ගෙන් ප්‍රකට වූ කරුණු පිළිබඳ සංක්ෂේපයක් මෙන් ම ඒ තුලින් බැස ගත හැකි පොදු නිගමනය ද අවසාන වශයෙන් කෙටියෙන් දක්වා ඇත.

ථෙරවාදයේ හා අමිතාභ සම්ප්‍රදායයේ බුද්ධාභිවාදන ක්‍රම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් පුළුල් අයුරින් මෙතෙක් සිදු වී නැත යනු අපගේ විශ්වාසයයි.

ආගමික චාරිත්‍ර වාරිත්‍ර හා පුද පූජා යනු සාමාන්‍ය මහජනතාව වෙත එම ආගම්වල දාර්ශනික හා ආචාර විද්‍යාත්මක හර පද්ධතිය සම්ප්‍රේෂණය කරනු ලබන ප්‍රබල මාධ්‍යයකි. ඒ අනුව එය එක්තරා අධ්‍යාපන ක්‍රමවේදයකි. එබැවින් මෙබඳු අධ්‍යයනයකින් මතු වන කරුණු සමකාලීන ආගමික ක්ෂේත්‍රයේ කාලානුරූප නවීකරණයන් සඳහා යොදා ගැනීමෙන් වඩාත් ඵලදායි සමාජ මෙහෙවරක් ඉටු කළ හැකිය යනු අපගේ විශ්වාසයයි.